# කැටයම් කලාවේදී සුවිශේෂී ස්ථානයක් හිමි වූ හස්තියා

ඉන්දු රාමනායක *

*Elephas maximus* යන සත්ත්ව විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන අලියා නැතහොත් හස්තියා සිව්පා සතුන් අතර සුවිශේෂී ස්ථානක් හිමිකර ගනී. ශ්‍රි ලංකාවේ මෙන්ම ලෝකයේ ද හස්තියා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික වශයෙන් වැදගත් වූ බවට සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ද සාක්ෂි දරයි. අලියා විවිධ අංශයන් යටතේ මානවයා හා සම්බන්ධවී ඇති අතර විවිධ කාර්යයන් සඳහා අලියා යොදාගෙන ඇත. මෙහිදී අවධානයට යොමු වන කැටයම් කලාවේ දී හස්තියා නිර්මාණකරණයේ දී සුවිශේෂී ස්ථානයක් ලැබී ඇති බව මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේදී හඳුනාගැනීමට හැකිවේ.

සිංහල කලා සැරසිලි සඳහා අලි ඇතුන් භාවිතා කර තිබෙන අතර විහාර ස්ථාන, රජ මාලිගා හා පාෂාණමය නිර්මාණයන් මුල් කරගෙන කැටයම් කලාව සඳහා අලියා යොදාගැනීමට පැරණි කලාකරුවන් සමත් වී තිබේ. ලී කැටයම්, ඇත් දත් කැටයම්, ගල් කැටයම්, වාත්තු කැටයම් හා පිත්තල කැටයම් ආදිය සඳහා යොදාගනු ලැබූ අතර එයින් අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා හා අලි ඇතුන් අතර පැවති සහසම්බන්ධතාවය මනාව අවබෝධ කරගත හැකි වේ. කැටයම් කලාවේ දී හස්තියා භාවිතා කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මුල් යුගයේ සිට දේශීය හා විදේශීය වශයෙන් ඇත් දත් කර්මාන්තයට විශේෂ ස්ථානක් හිමි වූ බවත්, ඇත් දත් භාවිතය තුළින් විවිධ කැටයම් නිර්මාණය කිරීම උදෙසා කලාකරුවා යොමු වී ඇති බවත්, හඳුනා ගැනීමට හැකිය. ආර්ථික වශයෙන් ද ඇත් දත් කර්මාන්තය එදා මෙදාතුර ප්‍රධාන ස්ථානයක් හිමි කරගෙන ඇති ආකාරයත් ඇත්දත් භාවිතා කිරීම තුළින් ප්‍රභූත්වය පෙන්වීම හා සෞභාග්‍ය උදාකර ගැනීමත් ආදී කරුණු බලපා ඇත. ලී කැටයම් හා ගල් කැටයම් භාවිතා කිරීම තුළින් ද ආගමික, සංස්කෘතික ආර්ථික හා සමාජීය ගොඩනැගිලි මෙන්ම කලා කෘතී මුල් කරගෙන හස්තියා යොදාගෙන ඇති ආකාරය දැකිය හැකිය.

හස්තියා පිළිබඳව ග්‍රන්ථ රචනා වී පැවතිය ද කැටයම් කලාව තුළ හස්තියා යොදාගැනීම පිළිබඳව විධිමත් පර්යේෂණයක් සිදුවී නොමැති අතර මෙම පර්යේෂණ පත්‍රිකාව තුළදී ශ්‍රී ලාංකීක සංස්කෘතිය තුළ හස්තියා කැටයම් කලාවෙහිදී යොදාගෙන ඇති ආකාරය, හස්තියා යොදාගැනීම සඳහා භාවිතා කරන ලද උපක්‍රම ආදි පුළුල් පරාසයක් පවතින ක්ෂේත්‍රය තුළින් එයින් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ. විශේෂයෙන් ලී සහ ගල් කැටයම්වල හස්තියා නිර්මාණය කර ඇති ආකාරයත්, ඇතුන්ගේ දළ භාවිතා කරමින් සිදු කරන ලද විවිධ නිර්මාණයන් කෙරෙහි ද මෙහිදී විමර්ශනයට ලක් වේ.

* රාමනායක, ආර්. බී. එම්. අයි. පී. කේ.
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය.
පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි අපේක්ෂිකා, කැලණිය විශ්වවිද්‍යාලය.
පුරාවිද්‍යා නිලධාරි, ප්‍රධාන කාර්යාලය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

## හැඳින්වීම

සකල විධ සත්ත්ව ග්‍රහණය අතර අලියා නැතිනම් ඇතා යනුවෙන් හඳුන්වන අපූර්වතම සිව්පා සත්ත්වයාට ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. එවගේම මිහිතලය මත වෙසෙන සත්ත්වයන් අතරින් ශරීර ප්‍රමාණයෙන් විශාලතම සත්ත්වයා ලෙස ද සැලකේ. සත්ත්ව වර්ගීකරණයට අනුව,

**අලියා / ඇතා (Elephant)**

- **සත්ත්ව විද්‍යාත්මක නාමය - *Elephas maximus***
- **පවුල - Elephant**

අයත් වේ.

මිහිමත ජීවත්වන විශාලම සත්වයෙකු ලෙස අලි ඇතුන් දෙස මානවයා බැලුවේ ගෞරව සම්ප්‍රයුක්ත බියකිනි. අලි ඇතුන් ශක්තිමත්, ප්‍රඥාවන්ත මෙන්ම කලහාකාරී සතුන් ලෙස වර්තමාන සමාජය තුළ මිනිසාගේ පිළිගැනීම වේ. දඩයක්කාර සමාජයට වඩා ගෝත්‍රික දඩයක්කරුවන් අතර අලි ඇතුන් පිළිබඳ විවිධ මිථ්‍යා මත පවතිනන්නා සේම ග්‍රාමීය සමාජය තුළ මෙය බහුලව දැකිය හැකිය.

ශ්‍රී ලාංකීක සමාජය තුළ අලියාට ප්‍රධාන තැනක් හිමිවුවා සේම මෙකී සත්ත්වයා කලාවට කැටයමට යොදාගත ඇති ආකාරය හඳුනාගැනීමට හැකිවේ. මුල් කාලයේ සිට වාසස්ථාන මෙන්ම ගෘහ අලංකරණය සඳහා විවිධ මාදිලියන් යටතේ නිර්මාණ සිදුකර ඇති අතර හස්ති කැටයම් ද දැව මෙන්ම පාෂාණ මුල් කරගෙන සිදු වී ඇත. නමුත් වර්තමානයේ සොයාගැනීමට හැකි වී ඇත්තේ ද පාෂාණමය නිර්මාණයන් පමණි. දැව නිර්මාණ විනාශවීම ඊට හේතුවයි. පාෂාණමය නිර්මාණවල හස්තියා යොදාගැනීම අනුරාධපුර මුල් භාගයේ සිට හඳුනාගැනීමට හැකිය. හස්තියාගේ දත් උපයෝගී කරගෙන සිදුකරන ලද කලා නිර්මාණයන් ද මුල් යුගයේ සිට පැවැති බවට පුරාවිද්‍යාත්මක මෙන්ම සාහිත්‍ය මූලාශ්‍රයන් තුළින් ද ගම්‍ය වන්නකි.

නියොලිතික යුගයට අයත් යැයි අනුමාන කරන දොරවක ලෙන ගුහා සිතුවම් අතර අලියෙකුගේ යැයි සැලකෙන සිතුවමක් වේ. මෙම ගල් ලෙනෙහි ඇතුළත බිත්තියෙහි ඉහළ මට්ටමේ අඩි 4-5 අතර උසකින් කැටයම් කර ඇති අලියෙකුගේ හා තලගොයකුගේ යැයි සැලකෙන රේඛා සටහන් ඇතුළු රේඛා සටහන් 52 සංඛ්‍යාවක් මතුකර දක්වා ඇත. ඒ අතර ඉහත රේඛා සටහන් දෙක දියුණු යුගයක ලක්ෂණ පෙන්නුම් කරන බව සඳහන් වේ (ජර්නල් ඔෆ් සිලොන් ඇන්ටික්වේරියන් ලිටරරි රෙජිස්ටර් 1918: 28).

හස්තියා පිළිබඳ සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් මුල් යුගයේ හස්තියා යොදාගත් ආකාරය හඳුනාගැනීමට හැකි අතර පසුකාලීනව කැටයම් නිර්මාණකරණයේ දී කලාකරුවා යොදාගන්නා ලද නිර්මාණ ස්වරූපය මෙන්ම යුගයෙන් යුගයට කැටයම් කලාවේ වර්ධනයන් හා එකිනෙකට වෙනස් ස්වරූපයෙන් හඳුනාගැනීමට හැකිය.

## අන්තර්ගතය

සිංහල කලා සැරසිලි සඳහා අලි ඇතුන් යොදාගැනීමට ප්‍රධාන තැනක් හිමි වූ අතර උත්තුංග භාවය, මහේශාක්‍ය භාවය මෙන්ම වාසනාවේ සුභ සංකේතයක් ලෙස ද හෙළ කලා ශිල්පීයා සැලකූ හෙයින් හැකි සෑම අවස්ථාවකම සිය කලා ශිල්පය සඳහා අලි ඇතුන් නිර්මාණයට යොමු වී ඇත. එහි දී චිත්‍ර, මූර්ති හා කැටයම් යන සෑම අංශයක දී නිර්මාණ කටයුතු සිදුකර ඇති ආකාරය පිළිබඳව සාධක වේ.

හස්තියා කැටයම් නිර්මාණයට පාදක කරගැනීමේ දී වස්තු විෂය ලෙස කොටස් කිහිපයක් යටතේ හඳුනාගත හැකි ය.

1. සාම්ප්‍රදායික මෝස්තර කලාව භාවිතා කිරීම
2. තත්කාලීන සමාජ තොරතුරු පාදක කර ගැනීම
3. ජීවත්වන පරිසරයේ දක්නට ලැබෙන සත්ත්ව විශේෂ නිරූපණය කිරීම
4. වාස්තුවිද්‍යාත්මක නිර්මාණවල සෞභාග්‍ය සඳහා යොදා ගැනීම

හස්තියා කැටයම් කලාවේ දී යොදාගැනීම මුල් යුගයේ සිට පැවති බව ප්‍රාග් ඓතිහාසික ස්ථානයන් මුල් කරගෙන සාධක හඳුනා ගැනීමටත් එකල විසූ මානවයා පරිසරය සමගම සම්බන්ධතා පැවැත් වූ අතර එහි දී දඩයම මූලික කරගෙන ජීවත් වූ මානවයා තමාට සමීපව ජීවත් වූ සතුන් ද වාසස්ථාන කරා රැගෙන ඒම තුළින් සත්ත්ව ගෘහස්ථකරණය ආරම්භ විය. ඒ අනුව ගෘහස්ථිතව ජීවත් වූ සතුන් අතර අලියා මිනිසාගේ ජීවන වෘත්තීයේ දී වැදගත් තැනක් ගන්නා ලදී.

## ගල් කැටයම්

ගුහා සංකේතයන් අතර සත්ත්ව කැටයම් නිර්මාණය කිරීමේ දී ස්වස්ථිකය මත්ස්‍ය, හස්තියා, ගවයා, හීය, චක්‍රය හා අංකුසය ජත්‍රය වැනි දෑ ඒ අතර වේ.

දොරවක ලෙනෙහි පවතින මෙම රේඛා සටහන තුළින් මුල් යුගයේ සිට හස්තියා කැටයම් කලාවට යොදාගෙන ඇති ආකාරය හඳුනාගත හැකිය (Bandaranayake 2006: 9-11). දේශීය නිර්මාණ ශිල්පයේ දී දැව සඳහා ප්‍රධාන තැනක් ලැබුණු අතර ශෛල කර්මාන්තය ද පැවැති අතර එහිදී විශාල නිර්මාණයන් සිදු කළ අතර එම නිර්මාණයන් සඳහා පාෂාණ යොදා ඇති ආකාරය පුදුම සහගතය.




දොරවක ලෙනෙහි හස්තියා යැයි සැලකෙන සටහන

හස්තියා යොදාගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී අනුරාධපුරයේ ඉසුරුමුණිය ඇත් රූපයත්, නෙළුම් පොකුණේ ජල ක්‍රීඩාවේ යෙදෙන

ඇත් සමූහයත් වැදගත් වේ. දිය කෙළිනා ඇතුන් සොඬෙන් වතුර ඉසින ඉරියව් සහිත ඇත් රංචුවක් මෙහි කැටයම් කොට තිබේ.



දඹදෙණිය විජයසුන්දරාරාමය විහාරය



අනුරාධපුර රන්මසු උයන

නිශ්ශංකමල්ල රජු දවස කරවන ලද පොළොනන්රුව ගල්පොත ශිලා ලිපියෙහි ඇතුන් දෙදෙනෙකු නමස්කාර කරන ලක්ෂ්මී දේවියගේ රුව ද දැකිය හැකිය.

අනුරාධපුරයේ රුවන්වැලි මහා සෑයේ ඇත් පවුර, අභයගිරියේ ඇත් පොකුණ හෙළ කලා ශිල්පීයාගේ අග්‍රගණ්‍ය නිර්මාණයන්ය. පොළොන්නරුවේ පරාක්‍රමබාහු මාලිගයේ ඇති ඇත් පෙරහැර චමත්කාර ජනකය. ඉමහත් භාවාත්මක මෙම ඇත් පෙරහැර නෙළා ඇත්තේ රාජවෙශී භුජංග මණ්ඩපයේ පාදම වටාය. දඹුලු විහාරයේ ද ඇති අලි ඇතුන් ද නිර්මාණය කර ඇති ආකාරය ද වැදගත් තැනක් ගනී.  පැරණි සිංහලයෝ සුදු ඇතුන්ට සැලකුවේ සෞභාග්‍යයේ සංකේතය ලෙසටය. දිඹුලාගල ගලේ සුදු ඇතා දණ නමා සිය දෙදළ වඳින සේ සිටීම මනරම් නිර්මාණයකි. කලා නිර්මාණයක් ලෙස සලකන සඳකඩපහණ සඳහා ද විවිධ කැටයම් යොදාගෙන ඇති ආකාරය දැකිය හැකිය. එහි දී ප්‍රධාන වශයෙන් සත්ත්ව රූප යොදාගැනීමේදී හස්තියා කැටයම්කොට තිබේ. මෙය අනුරාධපුර යුගයේ සිට ඉතා සංකීර්ණව පැවති ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක සාක්ෂි දරයි. එනම් මෙහිදී ඇත්, අස්, ගව, සිංහ යන සතුන් සතර දෙනා එකිනෙකා පසුපස දුවන ආකාරයට නිර්මාණයකොට තිබේ. මෙහිදී කලාකරුවා යොදාගන්නා ලද සංකේත අතර හස්තියා සළකුණින් උතුරු දිශා නිරූපනය කරන බව පෙන්වා දෙයි. මෙම සංකේත යොදාගැනීම පිළිබඳව විද්වතුන් අතර විවිධ මතයන් ද පවතියි.

ගෘහ නිර්මාණකරණයේ දී ප්‍රධාන තැනක් ගන්නා ලද නිර්මාණ අතර උළුවහු, පනේල ආදිය වැදගත් වේ. කෑගල්ල දිස්ත්‍රිකයේ අරණායක දිප්පිටිය විහාරයේ උළුවස්ස අලංකාර ලෙසින් කැටයම්කොට තිබේ. මෙහි දොරටුවට මුහුණලා සිටින ඇත් රූප දෙකකි. ඔවුන්ගේ පිට උඩ ඇත් ගොව්වෝ ද ඔවුනත හෙණ්ඩු ද වෙති. අම්බුළුගල විහාරයේ ද උළුවස්සෙහි ඇත් කැටයමක් දැකිය හැකි අතර ගල් උළුවස්සේ ඉහළ මෙය නිර්මාණය කොට තිබෙන අතර එය ක්‍රිස්තු වර්ෂ 15 වන සියවසට අයත් යැයි සැලකේ. එමෙන්ම මාතර දෙවුන්දර දේවාලයේ උළුවස්සෙහි ගජ ලක්ෂ්මී

කැටයමක් වන අතර ඒ දෙපස ඇත් රූප කැටයම් කර තිබේ (වික්‍රමගමගේ 1995: 42-46). මෙයින් පාෂාණමය කැටයම් සඳහා භාවිතා කර ඇති ආකාරය හඳුනා ගැනීමට හැකිය.


## ලී කැටයම්

දැව කැටයම් කලාව තුළින් කලාකරුවා විවිධ නිර්මාණ ඉතා විශිෂ්ට අන්දමින් සිදුකර ඇති ආකාරය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රයන්ගේ තොරතුරු සඳහන් වුවද මෑත කාලීනව පැවති නිර්මාණ පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධකයෝ ද පවතියි. දැව කැටයම් පිළිබඳව සඳහන් කරන ආනන්ද කුමාරස්වාමි මහතා පෙන්වා දෙන්නේ "හෙතෙම ගැට සහිත වකුටු ලී කැබැල්ලක් ගෙන, එය තම මැලි බවේ අනලස් බැවින් කැටයම් කොට,ඩතම උදාසීනත්වයේ දක්ෂතාවෙන් හැඩ ගස්වයි" යනුවෙනි (කුමාරස්වාමි 2011: 128). මුල් යුගයේ නිර්මාණය කරන ලද කැටයම් ලී ආශ්‍රය කරගෙන සිදුවන්නට ඇති හෙයින් ඒවා කාලයක් නොපැවතීම නිසා දීරා යාමට ලක් වන්නට ඇත. එසේ හෙයින් වර්තමානය වන විට ඒ පිළිබඳව සාධක සොයාගැනීම අපහසු වී ඇත. නමුදු මුල් කාලයේ නිර්මාණය කරන ලද පාෂාණ ආශ්‍රිත නිර්මාණ හස්ති කැටයම සහිත කලා කෘතීන් සොයාගැනීමට හැකී වී ඇත. එමෙන්ම මෙහි දී දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වනුයේ මානවයා ගෘහස්ථකරණයට යොමුවීමත් සමග ඒ ආශ්‍රයෙන් සත්ත්ව කොට්ඨාසයන් ද ගෘහස්ථකරණයට යොමුවීමත් නිසා අලියාට ද වැදගත් තැනක් හිමි විය.

මහනුවර යුගයෙන් පසුව නිර්මාණය කරන ලද දැව කැටයම් විවිධ සංරක්ෂණයන්ට භාජනය වුවද මේ දක්වා දැකිය හැකිය. කැටයම්කරුගේ නිර්මාණවලට ඇත්, අස්, ගව සහ අලියාගේ රූප වස්තු විෂය වීම එකී සත්ත්ව කොටස්වලට තත්කාලීන සමාජයෙන් ලැබී තිබූ තත්ත්වය මැනවින් විද්‍යමාන වේ. කෘෂිකාර්මික කටයුතු සහ ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම සංග්‍රාමික කටයුතු සඳහා යොදාගත් අලි ඇතුන් සහ සාමාන්‍ය ජනතාව අතර ඇති සමීප සබැඳියාව නිසා කැටයම්කරුගේ තේමාවට උක්ත සත්ත්ව කොටස් බෙහෙවින් පාදක වන්නට ඇත.

සැරසිලි ගණයට අයත් වන කුළුණු කැටයම්, දොර උළුවහු ආදිය කලාත්මක අගයෙන් මෙන්ම ඓතිහාසික තොරතුරු නිරූපණය අතින් ද ඉතා වැදගත් වේ.






කුරුණෑගල සිරිගල ටැම්පිට විහාරයේ ලී කැටයම්

පළමු රූපයේ දක්වෙන කැටයම නිදහස් ආකාරයෙන් නිර්මාණය කර ඇත. දෙවන ඡායාරූපයේ දක්වෙන අලියාගේ රූපය පමණට වඩා හකුළුවා තිබීම පනේලයේ හතරැස් සීමාවට ම සීමා වීමේ දැඩි අවශ්‍යතාවය පෙන්වයි. වන්දනා කිරීම සඳහා ඇතෙකු හෝ අලියෙකු දණ නමා ගත් විට හොඬය ඉහළට ඔසවා ගනී. මෙම කැටයමේ අභිප්‍රාය අලියා වන්දමාන කිරීම දක්වීම වුවත් සාමාන්‍යයෙන් හස්තීන්ගේ වන්දනාමාන ශෛලීය මෙය නොවේ. ඒ අනුව කැටයම් පරිශ්‍රයේ ඇති අවකාශය සීමා වී කැටයම නිර්මාණය කර ඇත. සාම්ප්‍රදායික කැටයම් ශිල්පියා ගෘහ නිර්මාණ ආශ්‍රිතව පනේලය තුළට කෙතරම් සීමා වී ඇති ද යන්න සිරිගල හා නාවින්න රජ මහා විහාරයේ ඇතෙකු දක්වෙන කැටයමෙන් පැහැදිලි වේ.



ඇම්බැක්කේ ලී කැටයම



බිහල්පොළ රජමහා විහාරයේ ලී කැටයම

රුවන්වැලි සෑ දාගැබ තුළ බෝධිසත්ව චරිතය හා බුද්ධ චරිතයේ විවිධ ලක්ෂණ කැටයම් කර ඇත.

ඇම්බැක්ක දේවාලයේ ද පනේල කැටයම් අතර හස්තියාගේ කැටයම දැකිය හැකිය. මේවා ද පනේල මත නිර්මාණය කිරීම ඉතා අලංකාරව සිදුකර ඇති ආකාරය හඳුනා ගැනීමට හැකිය. මෙහිදී විවිධ කැටයම් දැකිය හැකි අතර හස්තියාගේ විචිත්‍ර කැටයම් ඇත්තේ ද පේකඩ මතය (හෙට්ටිආරච්චි 1965: 252).

## මනඃකල්පිත කැටයම්

නිර්මාණකරුවා තමාගේ නිර්මාණයන් ස්වාධීන ලෙස ඉරිපත් කිරීමට නිතරම යොමුවිය. එහිදී කලාකරුවන් විවිධ අවස්ථාවන්හිදී මනඃකල්පිත නිර්මාණ කෙරෙහි යොමුවිය. එහි එක් අවස්ථාවක් ලෙස අලියා යොදාගනිමින් නිර්මාණය කරන ලද ගජසිංහ, ගණදෙවියන් හා මකර තොරණ ආදිය වැදගත් වේ. මෙම අධ්‍යයනයේ දී හස්තියා යොදාගනිමින් සිදු කරන ලද කැටයම් කලාවේදී මනඃකල්පිත කැටයම් බහුලව හමුවේ. ගජ සිංහයා යනු හස්තියාගේ හිසත්, සිංහ ශරීරයත් ඇති මනඃකල්පිත සතෙකි. ගජ සිංහයා අතිශය ප්‍රසිද්ධ සිංහල කැටයමකි. ගජ සිංහ කොඩිය නුවර කලාවියේ කොඩියයි. ඇම්බැක්කේ දේවාලයේ ගජසිංහ රූපයේ ලී කැටයමක් ඇත. ඇම්බැක්ක දේවාලයේ කුළුණක සිංහයෙක් සහ හස්තියෙක් අතර පොරයක් දැක්වෙන ලී කැටයම ද වැදගත් තැනක් ගනි.

යාපහුව මාලිගවේ ද්වාරයේ පඩිපෙළ දෙපස ගජසිංහ රූප දෙකක් නෙලා ඇත. ගම්පොළ හතහවන පරාක්‍රමබාහු රජු කර වූ ලංකාතිලක විහාරයේ ඇතුළු වන දොරටුව දෙපස විශාල ගජසිංහ රූප දෙකක් නෙලා ඇත. මේ වකවානුවටම අයත් කෑගලු දිසාවේ අලවතුර විහාරයේ ගජසිංහ රූප දෙකක් නෙළා ඇත. නුවර සමයට අයත් රාජධි රාජසිංහ රජු විසින් කරවන ලද දෙහිපාගොඩ අග්‍රබෝධි රජමහා විහාරයේ දොරටුව දෙපස ගජසිංහ රූප දෙකක් හා කැලණිය රජමහා විහාරයේ ශෛලමය ගජසිංහ රූප සියුම් ලෙස කැටයම් කර ඇති ආකාරය දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ගනේෂ රූපය ඇත් මුහුණකින් යුක්ත වූ නිර්මාණයකි. මෙය සිංහල කැටයම් කලාවට හින්දු අභාසය ලැබුණු බවට එක් නිදර්ශනයකි. මෙය කණ්ඨක චෛතීයේ වහල්කඩෙහි කැටයම්කර ඇති ආකාරය දැකිය හැකිය. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ සිට ගණ දෙවියන් ඇදහීම පිළිබඳව සාධක පවතියි. ගණ දෙවියන්ට වහරනු ලබන නම් රැසකි. ගණ දෙවියෝ හැඳින්වීම සඳහා විවිධ නම් භාවිතා කරති. ඒ අනුව ගණේෂ, ගණපති, චක්‍ර තුණ්ඩ, ඒකදන්ත, ඕම්කාරස්, වරුප විනායක, කණපති යන නම්වලින් හඳුන්වති. බුද්ධිය හා සාර්ථකත්වය අත්පත් කර දෙන දෙවියන් ලෙස ගණ දෙවියෝ සලකති.

හින්දු ආගමට අනුව ගණ දෙවියන් ශිව සහ පාර්වතිගේ පුතෙකි. ගණ දෙවියන්ට ඇත් හිසක් බිහි වීම කෙරෙහි පවතින දේව කතා කිහිපයක් වේ. ඒ අතරින් ප්‍රධාන වශයෙන් වැදගත් වන කතාව ලෙස ශිව දෙවියන්ට පාර්වති විසින් නිකරුනේ බැණ වැදීම නිසා ශිව දෙවියන් කෝපයට පත් වී තම රන් අසිපත ගෙන පාර්වතිට පහරක් එල්ල කළේය. ඒ අවස්ථාවේ තම මවට එල්ල කළ පහර

වළකාලීමට එතැනට ගිය සිය පුතු වූ ගණට එම පහර වැදිණි. එයින් දැඩි ලෙස දුකට පත් ශිව හා පාර්වතී විසින් සිය සෙබලුන්ට ප්‍රථමයෙන් හමුවන සත්ත්වයාගේ හිස වෙන් කරගෙන එන ලෙස දැන්විය. එහි දී සෙබලුන්ට ප්‍රථමයෙන් කුඩා ඇත් පැටවෙකු හමු අතර ඇත් පැටවාගේ හිස වෙන්කොට ගෙනවිත් ගණගේ කඳට සවි කළේය. එතැන් පටන් කුමරාට ඇත් හිසක් සමඟ ජීවිතය ලැබුණි.

ඉන්දීය සංස්කෘතිය තුළ ගණ දෙවියන්ට අපමණ ගරුත්වයක් ඇත. ලේඛකයන් සාහිත්‍යධරයන් බිහි කරන්නෙත් ඔවුන් මෙහෙයවන්නෙත් ගණ දෙවියෝය. වෙළෙන්දන් තුළ ගණ දෙවි මහිමය ඇත. සියලු ශාස්ත්‍රයන්ට ද ගණ දෙවියෝ අධිපති ය. බාධක දුරලමින් සාර්ථකත්වය කරා ඉදිරියට යෑමට ගණ දෙවියෝ පිහිට වෙති. නුවර කලාවිය ආශ්‍රිතව ගණ දෙවි වන්දනය හා කැටයම් බහුලව දැකිය හැකිය. ආගමට හෝ දහමට සම්බන්ධ නොවුවද ගණ දෙවියන් ඇදහීම දැකිය හැකිය. එසේම අලි ඇතුන්ගේ රුව සහිත කැටයම් සිතුවම් හා චිත්‍රපට වැඩසටහන් ඡායා පිටපත් ආදිය දැකිය හැකිය. අතීතයේ සිට මේ දක්වා වන්දානාමානය කළ බවට සාධක හමුවේ. මකර තොරණ නිර්මාණය කිරීමේදී සතුන් කිහිපදෙනෙකුගේ සංකලනයකින් සකස් වී ඇත. ක්‍රිස්තු වර්ෂ 13 වන සියවසට අයත් රාජාවලියෙහි ඒ පිළිබඳව සඳහන් වේ "ගජේන්ද්‍ර හස්තඃ කෘතසිංහ පාද...." (ගුණරත්න 1995: 142). යනුවෙන් මෙහිදී මකර තොරණ කැටයම් කිරීම සඳහා හස්තියා යොදාගෙන ඇති ආකරය පැහැදිලි වේ.

## ඇත් දත් කැටයම්

දේශීය කැටයම් කලාවේ වැදගත් නිර්මාණයක් ලෙස ඇත්දත් කැටයම් කලාව හැඳින්විය හැකිය. අතීතයේ සිට වැදගත්කමක් ගන්නා සේම ඇත් දළින් නිර්මාණය කරන ලද කලා කෘතීන් විශාල සංඛ්‍යාවක් පවතින අතර ඒවා කෞතුකාගාර හා විහාරස්ථාන මුල් කරගෙන දැකිය හැකිය. එමෙන්ම ප්‍රභුත්වය පෙන්වීම හා සෞභාග්‍යත්වය දැක්වීමට ඇත් දත් භාවිතා කර ඇත. ඇත් දළ උපයෝගී කොටගෙන සිදුකරන ලද නිර්මාණ පිළිබඳව වංශ කතාවල පිළිඹිබු වන අවස්ථාවක් වංසත්තප්පකාසීනියේ සඳහන් වේ. ඒ අනුව ''පළිඟු අතළ මනරම් බිමෙහි ඇත් දළින් කළ මනහර පළඟෙක්. . .'' **(වංස 2001; 401)** විවිධ නිර්මාණයන් කළ බවට සාධක පවතී. කැටයම් කලාවේ දී ඇත් දත් නිර්මාණ දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සුවිශේෂී තැනක් ගත්හ. ඇත් දත් කැටයම් කලාවේදී මොස්තර බහුලව යොදාගෙන ඇත.

ඇත් දත් කැටයම් කලාව ද මහනුවර හා දකුණු පළාත් ආශ්‍රිතව ඉතා ප්‍රසිද්ධ කාර්මාන්තයකි. මෙම කර්මාන්තය ආශ්‍රිතව පරම්පාරා වෙසෙනුයේ මාවනැල්ල උතුවන්කන්ද ආශ්‍රිතවය. මෙම ඇත් දළ කැටයම් සඳහා පලාපෙති, ලියවැල්, නාරිලතා මල, සැරපෙන්දියා, හංස, හේරුඬ, ලියපත් සහ අරිම්බුව වැනි සැරසිලි භාවිතා කිරීම දැකිය හැකිය. සුවඳ පාන් ඉසීම සඳහා ගජනා සම්ඩය, මහා ධාතු කරඬු පිළිම, වටාපත්, පුස්කොළ පොත් කම්බා හා ආභරණ පෙට්ටි ආදී භාණ්ඩ ඇත් දළ උපයෝගී කොටගෙන නිර්මාණය කර ඇති තවත් නිර්මාණ කිහිපයකි.



ඇත් දළ මංජුසාව



ඇත් දළ පනාව

ශ්‍රී ලංකාවේ ඇත් දත් කැටයම් කලාවට දීර්ඝ ඉතිහාසයක් ඇති බවට හමු වී ඇති සාධකවලින් අනාවරණය කරගැනීමට හැකි වී ඇත. ජෙට්ඨතිස්ස රජු විසින් ඇත් දත් කැටයම් කලාවේ විශිෂ්ට නිර්මාණයන් කළ බව සඳහන්වේ (මහාවංශය 2004 පරි-37; 100-103). නමුදු මේ පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක නොවුවද මෙම යුගය වන විට ඇත් දත් කර්මාන්තයෙහි ප්‍රවීණයන් සිටි බවත් ඒ ආශ්‍රිත කැටයම් කලාව වර්ධනීය අවධියක් තිබූ බවත් පිළිගැනීමට හැකිවේ.

මහා පරාක්‍රමබාහු රජ දවස පොළොන්නරුවේ උයනක් කරවා එහි අංග ඇත් දත් කැටයමින් අලංකාරය කළ බව සඳහන් වේ (මහාවංශය 2004 ඃ පරි 67) හතරවන භුවනෙකබාහු රජු දවස ඉන්දීය නිලාචාරීන් විසින් කැටයම් කර වූ බවත් එය කැටයම් කලාවේ උන්නතියට හේතු වූ බවත් සඳහන් වේ. ඇත් දළයෙන් කළ අගනා උළුස්සක් කුරුණෑගල රිදී විහාරයේ දක්නට ලැබේ. මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් තිබ්බටුවාවේ මහානායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි නිර්මාණය කරන ලද නිර්මාණයකි.

මහනුවර දළදා මාලිගයේ උඩ මළුවේ ද දක්නට ලැබෙන ඇත්දත් කැටයම් සහිත උළුවස්ස ඉතා වැදගත් කැටයමකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින්ම කරවා ඇත. මාතර හීන්තැටිය රජමහා විහාරයට අයත් ඇත් දත් මණ්ඩපය ද විචිත්‍ර නිර්මාණයකි.

අස්ගිරිය විජේසුන්දරාරාමයේ දක්නට ලැබෙන ඇත් දත් පිළිමය වැදගත් වේ. අභය මුද්‍රවෙන් යුක්ත මහනුවර යුගයේ චීවර ලක්ෂණ සහිතව නිර්මාණය කරන ලද මෙම බුද්ධ ප්‍රතිමාව මණ්ඩපයක් මත තැන්පත් කොට තිබේ. මෙම මණ්ඩපය ද මහනුවර යුගයේ පත්තිරිප්පුවට සමාන වන අතර එය ද හස්ති කැටයමින් අලංකාර කොට ඇත. එමෙන්ම වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැම්මේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජ විසින් පූජා කරන ලද විජිනිපතෙහි ඇත් දළ සහිත මිටක් විය. වර්තමානයේ මල්වතු විහාරයේ තැන්පත් කර ඇති මෙය කලාත්මක නිර්මාණයකි.

## සමාලෝචනය

කැටයම්කරණයේදී හස්තියා භාවිතා කොට ලී කැටයම්, ගල් කැටයම් හා ඒ ආශ්‍රිත පවතින මනඃකල්පිත කැටයම් මෙන්ම ඇත්දත් කැටයම් නිර්මාණය කර තිබේ. ඒ අනුව පැහැදිලි වන්නේ අලියා මුල් යුගයේ සිට මිනිසා හා සහසම්බන්ධ වී බවයි. මිනිසාගේ ජීවනෝපාය හා ආගමික කටයුතු මුල් කරගෙන යොදාගන්නා හස්තියාට ගරු කිරීමත්, එය කලාකරුවාගේ නිර්මාණයන් සඳහා භාවිතා කරමින් ජනතාවට වඩාත් සමීප කරවීමත් මෙහි දී අරමුණු වන්නට ඇති බවය.

හස්තියා කැටයම්කරණයේ දී යොදාගැනීම පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකාව යටතේ අවධානය යොමුකර ඇති අතර එහිදී පුළුල් පරාසයක් පවතින හස්ත කැටයම් තුළින් අතලොස්සක් මෙහි දී පවතින සීමාන්විතය තුළ ගෙනහැර දක්වන ලදී.

## ආශ්‍රිත ග්‍රන්ථ


- උලුවිස්හේවා, පී, 2001, උඩරට සිංහල බිතුසිතුවම්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේනතුව.
- සිරිගල විහාර ගවේෂණය, 2015, දඹදෙණිය ව්‍යාපෘතියඃ මධ්‍යම සංස්කෘතික අරමුදල, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
- වික්‍රමගමගේ චන්ද්‍රා, 1990, නවීන සමය 1818 - 1950 චිත්‍ර කලාව, පුරාවිද්‍යා දෙපඃ සංවත්සර අනුස්මරණ කලාපය, පස්වන වෙළුම (1890 - 1990) සංස්ඃ නන්දදේව විජේසේකර, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව, කොළඹ.
- පතිරාජ, සමරකෝන්, 2007, ඇම්බැක්ක, තරංග ප්‍රකාශක, අංක 52/3, රතුපස්වල, මුදුන්ගොඩ.
- ගුණරත්න එඩ්මන් රෝලන්ඩ් 1995 රූපමාලා, කොළඹ ජාතික කෞතුකාගාරය, කොළඹ.
- කුමාරස්වාමි, ආනන්ද, 2011 මධ්‍යකාලීන සිංහල කලා, එච්. එම්. සෝමරත්න (පරිඃ), තිසර ප්‍රකාශකයෝ, 129, දුටුගැමුණු වීදිය, දෙහිවල.
- ගොඩකුඹුර, චාර්ල්ස්, 1963 පනාවිටිය අම්බලමේ කැටයම්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.
- බටුවන්තුඩාවේ දේවරක්ඛිත හිමි හා හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි 2004 මහාවංශය (සිංහල)ඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
- හෙට්ටිආරච්චි, ඩී.ඊ 1967 සිංහල විශ්වකෝෂය (තුන්වන කාණ්ඩය) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.
- Journals of Ceylon Anticqe varients litery rejister 1918
- Wijayapala, W.H 1997 New light on the pre-history of Sri Lanka vol. I-II Unpublished.
- Bandaranayaka, Senaka 2006 The rock and wall painting of Sri Lanka, Stamford Lake (pvt) Ltd.